කොළඹ මහා නගර සභාව

1. ශ්‍රී ලංකා රජය (GOSL) විසින් අරමුදල් සපයනු ලබන මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු ආයෝජන වැඩසටහන

i. ශ්‍රී ලංකා රජය කොළඹ මහ නගර සභා බලප්‍රදේශය තුළ මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු යෝජන වැඩසටහන ඇමරිකානු ඩොලර් මිලියන 37.5 වියදමින් යුතුව සම්පූර්ණ කිරීම සඳහා කටයුතු යොදා ඇත. කිරුලපන ජල පෝෂක ප්‍රදේශයේ අර්ධ වශයෙන් නිම කරන ලද පොම්පාගාර සහ ගුරුත්ව අපජල ජාලය සම්පූර්ණ කිරීම සහ නාගරික අපජල පහසුකම් ධාරිතාව වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණයි.

ii. උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට තමන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද මත වගුව **1** හි ලැයිස්තුගතකර ඇති තනතුරු සඳහා අයදුම් කළ හැකිය .

2. යුරෝපා ආයෝජන බැංකුව (EIB) විසින් අරමුදල් සපයනු ලබන මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු ආයෝජන වැඩසටහන

i. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ යෝජන වැඩසටහන (GCWWMIIP 3වන කොටස යුරෝපීය යෝජන බැංකුවේ (EIB) අරමුදල් සමග ක්‍රියාත්මක වන අතර ඉහත ව්‍යාපෘතිය දැනටමත් ප්‍රදානය කර ඇත. මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාවට නංවනු ලබයි. 2027 දෙසැම්බර් 01 වන දිනට පෙර නිම කිරීමට අපේක්ෂා කරන ඉහත කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී සුදුසු තාක්ෂණික, මූල්‍ය සහ කොන්ත්‍රාත් අධීක්ෂණය සැපයීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පහත සඳහන් තනතුරු බඳවා ගැනීමට අදහස් කෙරේ. ව්‍යාපෘතියේ පිරිවැය යූරෝ මිලියන 50 කි.

ii. උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට තමන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද මත වගුව **2** හි ලැයිස්තුගතකර ඇති තනතුරු සඳහා අයදුම් කළ හැකිය .

වගුව **1**

තනතුර	තනතුරු සංඛ්‍යාව	කළමනාකරණ සේවා වක්‍ර ලේඛ අංක **2/2026** අනුව වැටුප් කාණ්ඩය	සුදුසුකම්
ප්‍රමාණ සමීක්ෂක	01	කාණ්ඩය - D 250,000 -2x10,000 270,000	(පහත 1 හෝ 2) 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ක්ෂේත්‍රයට අදාළ ප්‍රථම උපාධිය / උපාධිය හා සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම් **සහ** අදාල ක්ෂේත්‍රයේ පළ්ගත් වෘත්තීය ආයතනයකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්වය / ඒ හා සමාන වෘත්තීය සුදුසුකම්

			සමඟ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 06ක සේවා පළපුරුද්ද තිබීම 2. රජයේ දීප ව්‍යාප්ත සේවාවල II / III ශ්‍රේණියේ හෝ ඒ හා සමාන මට්ටමේ නිලධරයකු වීම සහ අදාළ ක්ෂේත්‍රයේ II / III ශ්‍රේණියක අවම අවුරුදු 06ක සේවා පළපුරුද්ද තිබීම
සහකාර ඉංජිනේරු	සිවිල් - 05 යාන්ත්‍රික - 01 විදුලි - 01	කාණ්ඩය - E 180,000 – 2x7500 195,000	(පහත 1 හෝ 2 හෝ 3) 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ක්ෂේත්‍රයට අදාළ ප්‍රථම උපාධිය / උපාධිය හා සමාන බවට පිළිගත් වෙනත් සුසුදුකම් හෝ ක්ෂේත්‍රයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ අදාළ සුවිශේෂී ක්ෂේත්‍රයේ අවම අවුරුදු 03ක සේවා පළපුරුද්ද තිබීම 2. ක්ෂේත්‍රයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ අදාළ සුවිශේෂී ක්ෂේත්‍රයේ අවම අවුරුදු 06ක සේවා පළපුරුද්ද තිබීම. 3. ක්ෂේත්‍රයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන

			කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ අදාළ සුවිශේෂී ක්ෂේත්‍රයේ අවම අවුරුදු 09ක සේවා පළපුරුද්ද තිබීම.
ව්‍යාපෘති ලේකම්	01	කාණ්ඩය - F 150,000 – 2x7500 165,000	(පහත 1 හෝ 2) 1. සිංහල භාෂාව / දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමගින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයන් හයකින් සමත් වීම සහ අ.පො.ස. (උසස් පෙළ) විභාගය විෂයන් තුනකින් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සහ පිළිගත් ආයතනයකින් ලබාගත් ලේකම් පරිචය පිළිබඳ සහතිකය හෝ වරලත් ලේකම් පරිචය සඳහා වන විභාගයක් හදාරමින් සිටීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම අවුරුදු 03ක සේවා පළපුරුද්ද තිබීම 2. අවම අවුරුදු 03ක සේවා පළපුරුද්ද සහිත වරලත් ලේකම්වරයකු වීම.
කොන්ත්‍රාත් විශේෂඥ	01	කාණ්ඩය - C 295,000 – 2 x 10,000 315,000	(පහත 1 හෝ 2 හෝ 3) 01. අදාළ ක්ෂේත්‍රයෙහි ප්‍රථම උපාධියක් ලබා තිබීම. සහ අදාළ ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

			සමඟ අදාළ ක්ෂේත්‍රයෙහි කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08ක පළපුරුද්දක් තිබීම. 02. අදාළ ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Corporate Membership) හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම. සමඟ අදාළ ක්ෂේත්‍රයෙහි කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 06ක පළපුරුද්දක් තිබීම. 03. රජයේ දීපව්‍යාප්ත සේවාවන්හි (All-Island Services) I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයෙහි ඊට සමාන තත්ත්වයක සිටීම. සහ අදාළ ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම. සමඟ I ශ්‍රේණියේ තනතුරෙහි හෝ අදාළ ක්ෂේත්‍රයෙහි ඊට සමාන තත්ත්වයක අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් තිබීම.

වගුව 2

තනතුර	තනතුරු සංඛ්‍යාව	කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 2/2026 අනුව වැටුප් කාණ්ඩය	සුදුසුකම්
තාක්ෂණ නිලධාරී	සිවිල් - 03 යාන්ත්‍රික - 01 විදුලි - 01	කාණ්ඩය - E 180,000 – 2 x 7,500 195,000	පහත 1 හෝ 2 හෝ 3 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ක්ෂේත්‍රයට අදාළ ප්‍රථම උපාධිය / උපාධිය හා සමාන බවට පිළිගත් වෙනත් සුසුදුකම් **හෝ** ක්ෂේත්‍රයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ** අදාළ සුවිශේෂී ක්ෂේත්‍රයේ අවම අවුරුදු 03ක සේවා පළපුරුද්ද තිබීම 2. ක්ෂේත්‍රයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ** අදාළ සුවිශේෂී ක්ෂේත්‍රයේ අවම අවුරුදු 06ක සේවා පළපුරුද්ද තිබීම. 3. ක්ෂේත්‍රයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන

			මට්ටමට නොඅඩු ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම සහ අදාළ සුවිශේෂී ක්ෂේත්‍රයේ අවම අවුරුදු 09ක සේවා පළපුරුද්ද තිබීම.
ඉදිකිරීම් කළමනාකරු	01	කාණ්ඩය - C 295,000 – 2 x 10,000 315,000	(පහත සඳහන් 1 හෝ 2 හෝ 3) 01. අදාළ ක්ෂේත්‍රයෙහි ප්‍රථම උපාධියක් ලබා තිබීම. සහ අදාළ ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම. සමඟ අදාළ ක්ෂේත්‍රයෙහි කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08ක සේවා පළපුරුද්දක් තිබීම. 02. අදාළ ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Corporate Membership) හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම. සමඟ අදාළ ක්ෂේත්‍රයෙහි කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 06ක සේවා පළපුරුද්දක් තිබීම. 03. රජයේ රජයේ දීපව්‍යාප්ත සේවාවක (All-Island Service) I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයෙහි ඊට සමාන තත්ත්වයක් දරන නිලධාරියෙකු වීම. සහ අදාළ ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) හෝ ඊට සමාන

			වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම. සමඟ I ශ්‍රේණියේ තනතුරෙහි හෝ අදාළ ක්ෂේත්‍රයෙහි ඊට සමාන තත්ත්වයක අවම වශයෙන් වසර 02ක සේවා පළපුරුද්දක් තිබීම.

<u>සටහන:</u>

ඉහත සුදුසකම් යටතේ සඳහන් කළ **ප්‍රථම උපාධි** සහ **පශ්චාත් උපාධි** සඳහා පහත කොන්දේසි අදාළ වේ.

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් රාජ්‍ය හෝ විදේශීය විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය / පශ්චාත් උපාධිය
   හෝ
2. පාර්ලිමේන්තු පනතක් මගින් පිහිටවනු ලැබූ විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය / පශ්චාත් උපාධිය
   හෝ
3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 "අ" වගන්තිය යටතේ පිළිගනු ලබන ප්‍රථම උපාධිය / පශ්චාත් උපාධිය

<u>නියමයන් හා කොන්දේසි:</u>

සේවා නියමයන් : සියලු ම පත්වීම් මූලික වශයෙන් කොන්ත්‍රාත් පදනම මත අවුරුදු එකක කාලයක් සඳහා වේ. ව්‍යාපෘතියේ කාල සීමාව, තනතුරේ අවශ්‍යතාවය සහ නිලධරයාගේ සතුටුදායක කාර්ය සාධනය මත වාර්ෂිකව කොන්ත්‍රාත්තුව දීර්ඝ කෙරේ.

වයස් සීමාව : අයඳුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 62 නොවැඩි විය යුතු වේ.

E සහ F කාණ්ඩවල තාක්ෂණික තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සඳහා වගු අංක 01 සහ 02 හි සඳහන් පළපුරුද්ද හැර අනෙකුත් මූලික සුදුසුකම් රාජ්‍ය අංශයේ සමාන තනතුරුවල සේවය කරන නිලධාරීන් සඳහා අදාළ නොවන අතර වගු අංක 01 සහ 02 අනුව අදාළ රාජ්‍ය නිලධාරියා විසින් ලබාගෙන ඇති පළපුරුද්ද/විශේෂීකරණය සැලකිල්ලට ගනිමින් එවැනි බඳවා ගැනීම් සිදු කළ යුතුය.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2026 ට අනුකූලව, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු ව්‍යාපෘතියට පත් කළ හැකිය.

බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය: 2026.03.28 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2026 අනුව, පත්කිරීමේ බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා බඳවා ගැනීම අවසන් කරනු ලැබේ. එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

අයදුම්පත් ඉදිරිපත් කිරීම: රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංවිධානවල දැනට සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා යොමු කළ යුතුය. උනන්දුවක් දක්වන අයදුම්කරුවන් අයදුම්පත සමඟ තම ජීව දත්ත හා තමන් විසින් සත්‍ය පිටපත් බවට සහතික කරන ලද අදාළ අධ්‍යාපන සුදුසුකම් සහ සේවා පළපුරුද්ද දැක්වෙන සහතිකවල පිටපත් සමඟ ව්‍යාපෘති අධ්‍යක්ෂ, මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතිය, අංක 86, මිලේනියම් මධ්‍යස්ථානය, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 7 යන ලිපිනයට 2026.11.27 වන දින පස්වරු 3.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ව්‍යාපෘතියේ නම සහ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව.

ඒ. ඩී. එස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.සේ)
කොළඹ මහා නගර සභාව